WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)**

**කෘෂි හා ආහාර තාක්ෂණය I, II**
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் **I, II**
Agriculture and Food Technology **I, II**

**කෘෂි හා ආහාර තාක්ෂණය II**

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

**1.** පාසල් ප්‍රදර්ශනයකට සූදානම් වන සිසු පිරිසක් විවිධ බෝග වගා ආදර්ශනය කිරීම, තවාන් සහ කොම්පෝස්ට් සැකසීම සහ කෘෂිකර්මයට සම්බන්ධ විවිධ ආකෘති නිර්මාණයට සූදානම් වූහ.

(i) මෙම ප්‍රදර්ශනය සඳහා ආදර්ශනය කළ හැකි තවාන් වර්ග **හතරක්** සඳහන් කරන්න.

(ii) උස් බිම් බෝග සඳහා තවාන් මිශ්‍රණය සැකසීමට අවශ්‍ය අමුද්‍රව්‍ය නම් කර නියමිත අනුපාත සඳහන් කරන්න.

(iii) එළවළු තවාන්වලට බහුලව වැළඳෙන රෝගයක් සඳහන් කර, එම රෝගයට හේතු වන රෝගකාරකය සඳහන් කරන්න.

(iv) (a) ප්‍රදර්ශනයේදී ආදර්ශනය කළ හැකි කොම්පෝස්ට් සැකසීමේ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(b) පසට කොම්පෝස්ට් එකතු කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

(v) නිර්පාංශු වගා ක්‍රම ආදර්ශනයේදී ඒ සඳහා යොදා ගත හැකි රෝපණ මාධ්‍ය **දෙකක්** සහ බහුලව භාවිත කරනු ලබන පෝෂණ මාධ්‍යයක් සඳහන් කරන්න.

(vi) ප්‍රදර්ශනය සඳහා සැකසිය හැකි රසායනික නොවන පළිබෝධනාශක **හතරක්** සඳහන් කරන්න.

(vii) (a) ප්‍රදර්ශන භූමියේ අලංකරණය පිණිස සකසා ඇති තෘණ භූමිය සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය කුමක් ද?
(b) ජලය සමග පොහොර යෙදිය හැකි සූක්ෂ්ම ජල සම්පාදන ක්‍රමයක් ආදර්ශනය කිරීම සඳහා පොලිතීන් මලුවල වගාකර ඇති මිරිස් වගාවකට සුදුසු ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න.

(viii) වැවක ආකෘතියක් නිර්මාණය කිරීමේදී ඊට ඇතුළත් කළ යුතු අංග **හතරක්** සඳහන් කරන්න.

(ix) ගව නිවාස ආකෘති සැකසීමේදී ඊට ඇතුළත් කළ යුතු ප්‍රධාන අංග **හතරක්** සඳහන් කරන්න.

(x) ගවයින් ගැට ගසා තබන ක්‍රමය අනුව සැකසිය හැකි ගව නිවාස ආකාර **දෙක** ලියන්න.

**2.** බෝග වගාවෙන් ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගැනීම සඳහා දේශගුණික සාධකවල බලපෑම් අධ්‍යයනය කිරීම වැදගත් වේ.

WWW.OLEVELAPI.COM

(i) (a) ශ්‍රී ලංකාව ප්‍රධාන කෘෂි දේශගුණික කලාප කීයකට බෙදා තිබේ ද?
(b) එසේ කලාපවලට බෙදීමට පදනම් වූ සාධක **දෙක** සඳහන් කරන්න.

(ii) (a) එක් ප්‍රදේශයක පරිසර උෂ්ණත්වය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න.
(b) බෝග වගාවේදී උෂ්ණත්වයේ හිතකර බලපෑම් **හතරක්** ලියන්න.

(iii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමවල පොදු අරමුණු **තුනක්** සඳහන් කරන්න.

**3.** ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා එක් පියවරක් ලෙස ආහාර පරිරක්ෂණය හඳුන්වා දිය හැකි ය.

(i) (a) පසු අස්වනු හානියට බලපාන පෙර අස්වනු සාධක **හතරක්** ලියන්න.
(b) බෝග අස්වනු ප්‍රවාහනයේදී දක්නට ලැබෙන දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ii) ආහාර පරිරක්ෂණ ක්‍රම **තුනක්** නිදසුන් සහිතව සඳහන් කරන්න.

(iii) (a) ආහාරවල අගය වැඩි කිරීමේ වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න.
(b) ආහාරවල අගය වැඩි කිරීමේ ක්‍රම **දෙකක්** ලියන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**4.** ශාක ප්‍රචාරණයේදී බීජ මෙන්ම වර්ධක කොටස් ද යොදා ගැනේ.

(i) බීජ මගින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි **හතරක්** සඳහන් කරන්න.

(ii) අඹ ශාකයකට අංකුර බද්ධයක් සිදු කරන ආකාරය නම් කළ රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) (a) බෝග වගාවේදී පාලිත තත්ත්ව ලබා දීම සඳහා සකස් කරනු ලබන ස්ථිර වගා ව්‍යුහ **හතරක්** සඳහන් කරන්න.

(b) නිර්පාංශු වගාවේදී භාවිත කරන රෝපණ මාධ්‍යයක තිබිය යුතු ලක්ෂණ **දෙකක්** ලියන්න.

**5.** පළිබෝධ පාලනය සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම යොදා ගැනීම වඩාත් සුදුසු වේ.

(i) (a) බෝග වගාවේදී අනුගමනය කරන ශෂ්‍ය විද්‍යාත්මක පළිබෝධ පාලන ක්‍රම **හතරක්** සඳහන් කරන්න.

(b) ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක **තුන** රෝග ත්‍රිකෝණයක් මගින් දැක්විය හැකිය. එම සාධක ලියන්න.

(ii) ස්පර්ශ වල්නාශක හා සංස්ථානික (පරිසර්පන) වල්නාශක අතර වෙනස කෙටියෙන් ලියා දක්වන්න.

(iii) (a) අවුලකපෝරා කුරුමිණියාගේ ජීවන චක්‍රයේ අවස්ථා පිළිවෙළින් දක්වන්න.

(b) එම කෘමියා හානි කරන්නේ කුමන කුලයේ බෝගවලට ද?

(c) එම හානිය පාලනය කරන ක්‍රම **දෙකක්** ලියන්න.

**6.** බෝගවලින් අපේක්ෂිත අස්වනු ලබා ගැනීම සඳහා ඌනතාවකින් තොරව ශාක පෝෂක ලබා දිය යුතු වේ.

(i) (a) බෝග වර්ධනය සඳහා අවශ්‍ය මහා පෝෂක **දෙකක්** සහ ක්ෂුද්‍ර පෝෂක **දෙකක්** වෙන වෙනම සඳහන් කරන්න.

(b) පසට යොදන රසායනික පොහොර බෝග මගින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ඉහළ නැංවීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ii) බහුවාර්ෂික බෝගවලට රොක් පොස්පේට් යෙදීම නිර්දේශ කළ ද වාර්ෂික බෝග සඳහා නිර්දේශ කරනුයේ ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) ය. මෙයට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ශාක වර්ධනයට පොස්පරස් පෝෂකයේ වැදගත්කම් **දෙකක්** සඳහන් කර පොස්පරස් ඌනතාවේදී ශාකවල දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න.

**7.** මානව පෝෂණයේදී ආහාරයෙහි ප්‍රෝටීන අවශ්‍යතාව සපුරාලීමට සත්ත්ව නිෂ්පාදන වැදගත් වේ.

(i) (a) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති ශ්‍රී ලංකාවේ ගව පාලන කලාප **හතරක්** සඳහන් කරන්න.

(b) ඉන්දීය ගව වර්ග හා යුරෝපීය ගව වර්ග අතර ඇති වෙනස්කම් **හතරක්** සඳහන් කරන්න.

(ii) කුකුළු පාලනයේදී යොදා ගැනීමට සුදුසු අතුරණුවක තිබිය යුතු ලක්ෂණ **හතරක්** ලියන්න.

(iii) (a) සත්ත්ව පෝෂණයේදී භාවිත කරනු ලබන සාන්ද්‍ර ආහාර හා දළ ආහාර අතර වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

(b) සාන්ද්‍ර ආහාර හා දළ ආහාර සඳහා උදාහරණ **දෙක** බැගින් ලියන්න.

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...